# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 මැයි මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 මැයි මස 22 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 9.00 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

## 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1998 මැයි මස 21 වන දින.]

එල්. ඩී.—ඕ. 29/96.

### පුරාවස්තු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පුරාවස්තු ආඥාපනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ :— — 188 වන අධිකාරයේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම.

"ශ්‍රී ලංකාවේ පුරාවස්තු සහ ශ්‍රී ලංකාව තුළ ඇති ඓතිහාසික හෝ පුරා විද්‍යාත්මක වැදගත්කමක් ඇති ස්ථාන සහ ගොඩනැගිලි වඩා හොඳින් සංරක්ෂණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ආඥා පනතකි.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි "හෝ විලක" යන වචන වෙනුවට "හෝ විලක හෝ ශ්‍රී ලංකාවේ දේශීය සමුද්‍රය ඇතුළත හෝ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති පිළිවෙලින් ඒ ප්‍රඥප්තියේ 15අ, 15ආ, 15ඇ සහ 15ඇ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 15අ, 15ආ, 15ඇ සහ 15ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"පුරාවස්තු සොරකම් කිරීමට සහ විනාශ කිරීමට අදාළ වැරදි.

පුරාවස්තු සොරකම් කිරීමට අදාළ වැරදි. — 15අ. වෙනත් යම් තැනැත්තකුගේ සන්තකයේ ඇත්තා වූ පුරාවස්තුවක් සම්බන්ධයෙන්, දණ්ඩ නීති සංග්‍රහයේ 366 වන වගන්තියේ අර්ථානුකූලව සොරකමක් කරන යම් තැනැත්තකු, මේ ආඥාපනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ

2—D 047389—5,900 (98/04)

අවුරුදු දෙකකට නොඅඩු වන්නා වූ ද අවුරුදු පහකට නොවැඩි වන්නා වූ ද කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

පුරාවස්තු විනාශ කිරීම ආදිය සම්බන්ධයෙන් දණ්ඩනය.

15ආ. යම් පුරාවස්තුවක් ඕනෑකමින්ම විනාශ කරන, හානියට පත් කරන, විරූපී කරන හෝ අයුතු ලෙස වෙනස් කරන, නැතහොත් එහි යම් කොටසක් ඕනෑකමින් පලුදු කරන යම් තැනැත්තකු මේ ආඥාපනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ඔහු යටත් විය යුතු ය.

මේ ආඥාපනත යටතේ වූ වැරදිවලට ඇප දිය නොහැකි බව.

15ඇ. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ ආඥාපනත යටතේ වරදකට චෝදනා ලැබූ හෝ වූදිතයකු වූ කිසිම තැනැත්තකු ඇප මත මුදා නොහැරිය යුතු ය.

සාක්ෂි.

15ඈ. මේ ආඥාපනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වූ නඩු පැවරීමක දී, යම් සහතිකයක විස්තර කරන ලද දෙය පුරාවස්තුවක් බවට පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන් කරන ලදැයි සලකනු ලබන විටක වැඩිදුර සාධක නොමැතිව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතු අතර, එහි ප්‍රකාශිත කාරණා සම්බන්ධයෙන් එය බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (1) වන උපවගන්තියේ "1850 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව කාලපරිච්ඡේදයක සිට පැවති තිබෙන හෝ පැවති තිබෙන්නේ යයි විශ්වාස කරනු ලබන"

යන වචන වෙනුවට, "අවුරුදු සියයකට නොඅඩු කාල පරිච්ඡේදයක් පැවතී තිබෙන හෝ පැවතී තිබෙන්නේ යයි විශ්වාස කරනු ලබන" යන වචන ආදේශ කිරීමෙන්.

(2) ඒ වගන්තියේ පැති සටහනෙහි "1850 ට පෙරාතුව කාල පරිච්ඡේදයේ සිට පැවතෙන" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "අවුරුදු සියයකට නොඅඩු කාල පරිච්ඡේදයක් පවතින" යන වචන ආදේශ කිරීමෙන්.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ ඇති "මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ" යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට, "වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු හා අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ ඇති "මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ" යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට, "වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු හා අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ V වන කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, ඒ ප්‍රඥප්තියේ Vඅ කොටස වශයෙන් බලපැවැත්විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ Vඅ අලුත් කොටස ඇතුළත් කිරීම.

"Vඅ කොටස

## උපදේශක කමිටුව

උපදේශක කමිටුව පිහිටුවීම.

39අ. (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් (මෙහි මින් මතු "උපදේශක කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) පුරා විද්‍යාත්මක උපදේශක කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (අ) මේ ආඥාපනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හා බලාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍යයයි අමාත්‍යවරයා සලකනු ලබන කාරණා සියල්ලම හෝ යම් කාරණාවක් පිළිබඳව ; සහ

(ආ) මේ ආඥාපනත යටතේ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්ය කිරීම හා සම්බන්ධ කාරණා පිළිබඳව ඔහු විසින් උපදෙස් අපේක්ෂා කරනු ලැබූ විටෙක

පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් දීම, ඒ උපදේශක කමිටුවේ කර්තව්‍ය වන්නේ ය.

(3) අමාත්‍යවරයා විසින්, තමා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසි මත යම් සාමාජික සංඛ්‍යාවක් ඒ උපදේශක කමිටුවට පත් කරනු ලැබිය හැකි ය.

(4) උපදේශක කමිටුවේ රැස්වීම්වල ගණපූරණයක් සඳහා අවශ්‍ය සාමාජික සංඛ්‍යාව නිශ්චය කිරීමේ බලය ද ඇතුළු, එහි කාර්ය පටිපාටිය නියම කිරීමේ හා විධිමත් කිරීමේ බලය, උපදේශක කමිටුවට ඇත්තේ ය. උපදේශක කමිටුවේ සෑම සාමාජිකයකු ම, තමා කලින් ඉල්ලා අස්වන්නේ නම්, මිය යන්නේ නම් හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන්නේ නම් මිස, අවුරුදු දෙකක කාලයකට ධුරය දැරිය යුතු ය.

(5) උපදේශක කමිටුවේ සාමාජිකයකු විසින් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) ඉල්ලා අස්වීම නිසා හෝ ඔහුගේ ධුර කාලය ඉකුත්වීම නිසා හෝ තම ධුරය හිස් කරන සාමාජිකයකු නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(7) උපදේශක කමිටුවේ සාමාජිකයකු අසනීපයක් හෝ වෙනත් දුබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරවීම හේතුකොට ගෙන, ස්වකීය ධුරයේ කටයුතු කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(8) උපදේශක කමිටුවේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම යෝග්‍ය යයි අමාත්‍යවරයා සලකන අවස්ථාවක ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් ඔහු විසින් එසේ කරනු ලැබිය හැකි ය.".

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියට පෙරාතුව ම, VI වන කොටසෙහි දැක්වෙන ශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ VI වන කොටසට ඉක්බිතිවම දැක්වෙන ශීර්ෂය ප්‍රතියෝජනය කිරීම.

"පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල හා කාර්ය".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල.

40. පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත—

(අ) ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තියක් සකස් කිරීමට සහ ඒ ප්‍රතිපත්තිය ආණ්ඩුව විසින් අනුමත කිරීමෙන් පසු එය සම්බන්ධීකරණය කිරීමට හා ක්‍රියාත්මක කිරීමට ;

(ආ) ශ්‍රී ලංකා පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ ලේඛනයක් සකස් කිරීමට ;

(ඇ) එම පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීමට හා පවත්වා ගෙන යාමට ;

(ඇ) ශ්‍රී ලංකා පුරාවිද්‍යා උරුමයේ සෑම අංශයක් සම්බන්ධයෙන් ම, විශේෂයෙන් ප්‍රාග් ඓතිහාසික, මූල ඓතිහාසික පුරාතන ඓතිහාසික, මධ්‍යම ඓතිහාසික හා පශ්චාත් ඓතිහාසික යුග හා සාමාන්‍ය හෝ නිශ්චිත මත, ක්‍රම හා අභ්‍යාස සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීමට ;

(ඉ) උචිත පුරාවස්තු ප්‍රදර්ශන, ප්‍රකාශන හා වෙනත් ක්‍රම මගින් ශ්‍රී ලංකා පුරා විද්‍යාත්මක උරුමය පිළිබඳව මහජනයා දැනුවත් කිරීම වැඩි කිරීමට ;

(ඊ) සුදුසු යයි සලකන අවස්ථාවල දී විශේෂිත ස්ථානවල හෝ ආගන්තුක මධ්‍යස්ථානවල ඇතුල්වීමේ ගාස්තුවක් අය කිරීමට ;

(උ) ආණ්ඩුව හෝ යම් තැනැත්තකු විසින් කිරීමට යෝජිත සංවර්ධන, කාර්මික හෝ වෙනත් ව්‍යාපෘති වලින් බලපෑමක් සිදුවිය හැකි ප්‍රදේශ පිළිබඳ පුරාවස්තු හානි අගැයුමක් කිරීම හා අවශ්‍ය පරිදි හානි අඩු කිරීමේ වැඩ පිළිවෙලවල් කිසිවක් ක්‍රියාවේ යෙදවීමට

මෙයින් බලය දෙනු ලැබේ.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

“පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා දිසාපතිවරයාට හා වෙනත් නිලධරයන්ට බලය දීම.

43. (1) පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මේ ආඥාපනත යටතේ වූ ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක්—

(අ) යම් දිස්ත්‍රික්කයක් හෝ ප්‍රදේශයක් ඇතුළත පිළිවෙලින් ඒ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති හෝ දිසා ලේකම්වරයා හෝ ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ විසින්;

(ආ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින්; හෝ

(ඇ) යම් බලයදීමක දී සඳහන් කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසි මත ඒ බලයදීමේ සඳහන් විය හැකි යම් ප්‍රදේශවල ඇත්තා වූ ස්මාරක හා පුරාවස්තු සංරක්ෂණය කිරීමෙහි, ගවේෂණය කිරීමෙහි, කැණීමෙහි, පිළිසකර කිරීමෙහි හෝ නඩත්තු කිරීමෙහි ලා හෝ ඒ සම්බන්ධයෙන් විශේෂ දක්ෂතා සහ සම්පත් සතු යම් තැනැත්තකු විසින්

ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ හෝ ඉටු කිරීමේ බලය සාමාන්‍ය වශයෙන් හෝ විශේෂයෙන් දෙනු ලැබිය හැකි යඃ

එසේ වුවද, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඒ බලය දීමෙන් එහි කාර්යය හා අරමුණු සතුටුදායක අන්දමින් ඉටු නොවන බැව් තම අදහස වන්නේ නම්, යම් අවස්ථාවක දී ඒ බලයදීම ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය; නැතහොත් ඉල්ලා අස්කරගනු ලැබිය හැකි ය.

(2) වෙනත් දේ අතර, බලය දීමේ අරමුණු, ස්වකීය නාමිකයින් විසින් හෝ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධීක්ෂණය කිරීමේ ක්‍රමය, යොදාගනු ලැබ ඇති කාර්ය පරිපාටි සටහන් කිරීම, ප්‍රගතිය වාර්තා කිරීම හා වාර්තා ලිවීම නිශ්චිතව සඳහන් කෙරෙන බලය දීම, ලියවිල්ලකින් විය යුතු ය.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ඒ ප්‍රඥප්තියේ 43අ සහ 43ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 43අ සහ 43ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"යෝජිත සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ හානි අගැයුම.

43අ. (1) 40 (ආ) වගන්තිය යටතේ පිළියෙල කරන ලද ලේඛනයට ඇතුළත් වන යම් ඉඩමක් හෝ නියම කරනු ලැබිය හැකි යම් ඉඩමක් භාවිතයට ගැනීම, අයුතු ලෙස ඇඳාගැනීම හෝ ජලයෙන් යට කිරීම සිදුකෙරෙන යම් සංවර්ධන හෝ කාර්මික යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපෘතියක්, ආණ්ඩුව හෝ වෙනත් ආයතනයක් හෝ තැනැත්තකු විසින් යෝජනා කරනු ලැබූ සෑම අවස්ථාවක දී ම, ඒ ඉඩමට හෝ

ඒ ඇතුළත වූ පුරාවස්තු කිසිවකට, ඒ යෝජනා ක්‍රමය, හෝ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ඇතිවිය හැකි ප්‍රතිඵල පිළිබඳව පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වාර්තාවක් ඉදිරිපත් කරනු ලබන තුරු, ඒ යෝජනා ක්‍රමය හෝ ව්‍යාපෘතිය අනුමත කිරීම හෝ ඊට අවසර දීම, කරනු නොලැබිය යුතු ය.

(2) ප්‍රශ්නයට අදාළ ඉඩම හෝ ඒ මත වූ පුරාවස්තු පිළිබඳ පෞරාණික, ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක ස්වභාවය හෝ වටිනාකම හේතුකොටගෙන ඇති විය හැකි ප්‍රතිඵල අගැයීම සඳහා ඒ ව්‍යාපෘතියේ හෝ යෝජනා ක්‍රමයේ අනුග්‍රාහකයන්ගේ වියදමින්, හානි අගැයුම් සමීක්ෂණයක් කරවීමට පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කටයුතු සැලැස්විය යුතු අතර, එකඟවිය හැකි යම් කාල පරිච්ඡේදයක් ඇතුළත (කෙසේ වුව ද, ඒ සමීක්ෂණයේ වියදම, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනාරාල්වරයා වෙත තැන්පත් කිරීමෙන් සති හයක් පසු නොවී) ව්‍යාපෘතියේ අනුග්‍රාහකයන්ගේ වියදමින්, ඒ ඉඩමේ ඇති පුරාවස්තු කිසිවක් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම, කැණීම, ලේඛනාරූඪ කිරීම හා ප්‍රකාශයට පත් කිරීම සහ අවශ්‍ය වේ නම්, නැවත ස්ථානගත කිරීම පිණිස පියවර ගැනීමෙහි ලා අවශ්‍ය වන අතිරේක වියදම් කිසිවක් වේනොත්, ඒ පිළිබඳ ඇස්තමේන්තුවක් ද සහිත, යෝජිත ව්‍යාපෘතිය හෝ යෝජනා ක්‍රමය නිර්දේශ කරමින්, ඊට විරුද්ධ වෙමින් හෝ වාර්තාවෙහි සඳහන් කරනු ලබන යම් කොන්දේසි හෝ වෙනස්කම්වලට යටත්ව නිර්දේශ කරමින් හෝ වූ ස්වකීය ලිඛිත වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ සඳහන් පරිදි එවැනි සෑම යෝජනා ක්‍රමයක හෝ ව්‍යාපෘතියක ම අනුග්‍රාහකයන් විසින්, එහි මුළු පිරිවැයෙන් සියයට එකකට වැඩි නොවන මුදලක්, මේ වගන්තියේ කාර්ය හා අරමුණු සඳහා සපයා වෙන් කරනු ලැබිය යුතු ය.

(4) වෙනයම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද, මේ වගන්තියේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අනුකූලව කටයුතු කළ යුතු කොන්දේසි.

43ආ. (1) යම් කොන්දේසියකට හෝ වෙනස් කිරීමකට යටත්ව, යම් යෝජනා ක්‍රමයකට හෝ ව්‍යාපෘතියකට අනුමතය හෝ අවසරය දෙනු ලැබ ඇති අවස්ථාවක, ඊට අනුකූලව කටයුතු කිරීම, අනුග්‍රාහකයන්ගේ කාර්යය වන්නේ ය. යම් කොන්දේසියකට හෝ වෙනස් කිරීමකට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීම මේ ආඥාපනත යටතේ වරදක් වන අතර, ඒ යෝජනා ක්‍රමය හෝ ව්‍යාපෘතිය වහාම නතර කිරීමට පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපෘතියක් එසේ නතර කරනු ලැබූ අවස්ථාවක, අනුමතය හෝ අවසරය දෙන ලද්දේ යම් කොන්දේසියකට හෝ වෙනස් කිරීමකට යටත්ව ද ඒ කොන්දේසියට හෝ වෙනස් කිරීමට අනුකූලව අනුග්‍රාහකයන් විසින් ප්‍රමාණවත් ලෙස කටයුතු කරනු ලබන තුරු සහ ඒ සඳහා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලිඛිත අවසරයක් ලබා ගන්නා තුරු, ඒ යෝජනා ක්‍රමයේ හෝ ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය "රුපියල් සියයකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට" යන වචන වෙනුවට, "රුපියල් පණස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.

"තැගි අරමුදල.

46. (1) නීති විරෝධී ලෙස ප්‍රයෝජනයට ගත් පුරාවස්තු ආපසු ලබා ගැනීමට හෝ ස්ථාන හා පුරාවස්තු ආරක්ෂා කිරීමට හෝ දායකවන තොරතුරු සපයන්නන්ට සහ ක්‍රියාත්මක කිරීමේ නිලධරයන්ට තෑගිදීමේ කාර්යය සඳහා (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "පුරාවස්තු තෑගි අරමුදල" යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පුරාවිද්‍යා

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාලනය හා පරිපාලනය යටතේ පිහිටුවනු ලැබේ.

(2) අරමුදලට—

(අ) මේ ආඥාපනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් වරදකරුවීම් පිළිබඳව යම් අධිකරණයක් විසින් අය කරගනු ලබන, සියලු දඩ මුදල්වලින් අඩක් :

(ආ) පුද්ගලයන්ගෙන්, සමිතිවලින් හෝ ආයතනවලින් ලැබෙන පරිත්‍යාග :

(ඇ) වෙනත් යම් නියමිත ගෙවීමක්

බැර කරනු ලැබිය යුතු ය.

(3) විගණකාධිපතිවරයා විසින්, වාර්ෂිකව අරමුදල විගණනය කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපවගන්තියේ (ඒ) ඡේදය, එහි (ඕ) ඡේදය වශයෙන් නැවත අකුරු යෙදීමෙන් ;

(ආ) (ඒ) ඡේදය අවසානයේ දැක්වෙන "සහ" යන වචනය ඉවත් කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (ජ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ඒ) අරමුදලින් තෑගි ගෙවීම කරනු ලැබිය යුතු ආකාරය නිශ්චය කිරීම ;

(ඔ) අරමුදල පරිපාලනය කිරීම ; සහ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "පුරාවස්තුව" යන වචනයේ අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

" "පුරාවිද්‍යාත්මක උරුමය" යන්නෙන්, මනුෂ්‍ය වර්ගයාගේ භෞතික උරුමයේ යම් කොටසක් පිළිබඳ ප්‍රාථමික තොරතුරු පුරාවිද්‍යාත්මක ක්‍රමවලින් සැපයෙන්නේ ද ඒ කොටස අදහස් වන අතර ඊට මානව පැවැත්මේ සියලු ශේෂ ලාංඡන, සහ මානව ක්‍රියාකාරීත්වයේ සියලු ලක්ෂණවලට අදාළ ස්ථාන ද අත්හැර දමන ලද ව්‍යුහය ද (පොළොව යට හා දිය යට ස්ථාන ද ඇතුළුව) සියලු වර්ගවල නෂ්ටාවශේෂ සහ ඒවා ආශ්‍රිත පහසුවෙන් ගෙන යා හැකි සියලු සංස්කෘතික ද්‍රව්‍ය ද ඇතුළත් වේ.";

(2) "ස්මාරකය" යන වචනයේ අර්ථ කථනය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

" "ස්මාරකය" යන්නෙන්, යම් ගොඩනැගිල්ලක් හෝ වෙනත් ව්‍යුහයක් හෝ ඉදිකිරීමක් හෝ යම් සොහොන් ගෙයක්, ස්තූපයක් හෝ වෙනත් භූමදාන ස්ථානයක් හෝ එවැනි ස්වභාවයේ වෙනත් යම් නිශ්චල දේපළක් හෝ ඒවායේ යම් කොටසක් හෝ නෂ්ටාවශේෂ හෝ ඓතිහාසික හෝ ප්‍රාග් ඓතිහාසික ජනාවාස හෝ ක්‍රියාකාරකමක ද්‍රව්‍යමය නෂ්ටාවශේෂ සොයාගත හැකි වෙනත් යම් ස්ථානයක් හෝ අදහස් වන අතර, යම් ස්මාරකයක් ඇති ස්ථානයක් හා යම් ස්මාරකයක් වටා වැට බැඳීම හෝ එය ආවරණය කිරීම හෝ අන්‍යාකාරයකින් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය විය හැකි, එවැනි ස්ථානයකට යාබද ඉඩමක යම් කොටසක් ඊට ඇතුළත් වේ .";

(3) "නියෝගය" යන වචනයේ අර්ථ කථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථ කථනය එක් කිරීමෙන් :—

" "දේශීය සමුද්‍රය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප නීතිය යටතේ කරන ලද ප්‍රකාශනයක් මගින් ශ්‍රී ලංකාවේ දේශීය සමුද්‍රය වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශයක් අදහස් වේ.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධානවල "පුරාවිද්‍යා කොමසාරිස්වරයා" යන වචන යෙදෙන කවර තැනක වුව ද, "පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන ආදේශ කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන පිළිබඳ පොදු සංශෝධනය.

වෙනත් ලිඛිත නීති සංශෝධනය කිරීම.

**18.** (ප්‍රධාන ප්‍රඥප්තිය නොවන) යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක හෝ ඒ ලිඛිත නීතිය මගින් හෝ ඒ යටතේ නිකුත් කරන ලද, සාදන ලද, නියම කරන ලද හෝ අන්‍යාකාර වූ යම් දැන්වීමක, සහතිකයක, පණිවුඩයක, ආකෘතියක හෝ වෙනත් ලේඛනයක, මේ පනත ආරම්භවීමට පෙර ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ පත් කරන ලද පුරාවිද්‍යා කොමසාරිස්වරයා බව හැඟවීම සඳහා "පුරාවිද්‍යා කොමසාරිස්වරයා" යන වචන යෙදෙන කවර තැනක වුව ද, ඒ වෙනුවට, "පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන ආදේශ කරනු ලැබේ.

ගිවිසුම් සම්බන්ධයෙන් ආරක්ෂා කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ පත් කරන ලද පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ තත්ත්වයෙන් ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් මේ පනත ආරම්භවීමේ දිනට පෙරාතුව ම සාදන ලද, නිකුත් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද කවර වූ හෝ සෑම ගිවිසුමක්, සම්මුතියක්, වෙනත් ලේඛනයක් හෝ සාධන පත්‍රයක් ම, ඒ දින සහ ඉන් පසුව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් සාදන ලද, නිකුත් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද හෝ සාදනු ලබන, නිකුත් කරනු ලබන හෝ ලියා අත්සන් කරනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**20.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.